# නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයට අයත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ නිවාස මාතා, III ශ්‍රේණිය තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2017

නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයට අයත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ නිවාස මාතා, III ශ්‍රේණිය තනතුරට දිස්ත්‍රික් කුසලතා අනුපිළිවෙල මත බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගයට පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති නැගෙනහිර පළාතේ ස්ථිර පදිංචි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය **2017.07.25** දින වේ. මෙම විභාගය ඉල්ලුම්පත්‍ර භාර ගැනීම අවසන් කළ පසු හැකිතාක් ආසන්න දිනෙක, නැගෙනහිර පළාතේ නගර හතරකදී පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පවත්වනු ලැබේ.

**02. බඳවා ගැනීම සඳහා වන සේවා කොන්දේසි ඃ-**

2.1 මෙම තනතුර ස්ථිරය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු අතර, අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුව සේවා කොන්දේසි තීරණය කරනු ලැබේ.

2.2 මෙම දැන්වීමට අනුව ඉල්ලුම් කරනු ලබන අයදුම්කරුවන් වෙනුවෙන්, නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයෙන් සමත්වන අයදුම්කරුවන් සඳහා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. ලිඛිත තරග විභාගයෙන් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගන්නා ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙල මත, සුදුසුකම් සහිත අයදුම්කරුවන් දිස්ත්‍රික්කයේ පවතින පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.

2.3 මෙම තනතුර සඳහා අයදුම් කළ හැකි වන්නේ **කාන්තා අයදුම්කරුවන්ට** පමණි.

2.4 මෙම පත්වීම ලබන අය නැගෙනහිර පළාතේ කවර ප්‍රදේශයක වුවද සේවය කළ යුතුය. එමෙන්ම නැගෙනහිර පළාතේ අවුරුදු 10 ක අනිවාර්ය සේවා කාලයක් සම්පූර්ණ කළ යුතු වේ.

2.5 ඉහත සඳහන් තනතුර සඳහා අයදුම් කිරීමේදී දැනටමත් රාජ්‍ය/නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත සුදුසුකම් ඇති අය තම තමන්ගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේ අයදුම් කිරීමේදී ඉහත සඳහන් තනතුරට අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය එම තනතුරෙන් මුදාහැරිය හැකි බවට දෙපාර්තමේන්තු ප්‍රධානියා සහතික කළ යුතුය. දෙපාර්තමේන්තු ප්‍රධානියා අනුමත නොකළ අයදුම්පත් ඉදිරිපත් කරන අය මෙම තනතුරට තෝරාගත හොත් නව පත්වීමක් සේ සලකා කටයුතු කරනු ලැබේ.

**03 වැටුප ඃ-** රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 ට අනුව, (MN 1-2016)
රු.27,140-10x300-11x350-10x495-10x660- රු. 45,540/- වේ.

2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි II වන උපලේඛනයේ සඳහන් පරිදි ගෙවීම් සිදුකරනු ලැබේ.

**04 බඳවා ගැනීම සඳහා වන මූලික සුදුසුකම් ඃ-**

**4.1 වයස් සීමාව ඃ-**

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා වයස අවුරුදු 30 ට නොවැඩි විය යුතුයි.

**4.2 අධ්‍යාපන සුදුසුකම් ඃ-**

i. සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ වෙනත් විෂයයන් දෙකකට (02) සම්මාන සාමාර්ථයන් සහිතව **එක් වරකදී** විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

**සහ**

ii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

4.3 පළපුරුද්ද ඃ-

මේ හා සමාන තනතුරක වැඩ කිරීමෙන් පළපුරුද්දක් ලබා තිබීම වඩා යෝග්‍ය වේ.

සටහන **අ.පො.ස.(සා.පෙළ) ප්‍රතිඵල සහතිකය, අ.පො.ස.(උ.පෙළ) ප්‍රතිඵල සහතිකයේ සහතික කරන ලද පිටපත් අයදුම්පත්‍රය සමඟ අමුණා එවීම අනිවාර්ය වන අතර, එසේ අමුණා එවනු නොලබන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. මේ සම්බන්ධයෙන් පසුව ඉදිරිපත් කරන ඉල්ලීම් හෝ පැමිණිලි සලකා බලනු නොලැබේ.**

**05. පොදු සුදුසුකම් ඃ-**

5.1 අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

5.2 විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

5.3 අයදුම්පත් භාර ගන්නා අවසන් දිනයට පූර්වාසන්නයෙන් අවම වශයෙන් එක් (01) අවුරුද්දක්වත් අඛණ්ඩව නැගෙනහිර පළාතෙහි පදිංචි වී සිටීම.

හෝ

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනයට පූර්වාසන්නයෙන් අවම වශයෙන් අවුරුදු තුනක්වත් (03) අඛණ්ඩව නැගෙනහිර පළාතෙහි පදිංචිව සිටින අයෙකු සමග ආවාහ/විවාහ වී වෙනත් පළාතක සිට මෙම පළාතට පැමිණ ඒ බව සනාථ කළ හැකි ලේඛන ඉදිරිපත් කළ හැකි අයෙකු වීම.

සටහන ඃ- **ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කළ ග්‍රාම නිලධාරී සහතිකය සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.**

**06 බඳවා ගැනීමේ ක්‍රමය ඃ-**

6.1 නැගෙනහිර පළාත් සභාව සඳහා අනුමත බඳවා ගැනීමේ පරිපාටියට, රජයේ චක්‍රලේඛවලට හා ඉහත 2.2 හි සඳහන් විධිවිධානවලට අනුකූලව බඳවා ගනු ලැබේ. ලිඛිත තරග විභාගයෙන් සමත්වන අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවා මෙම දැන්වීමෙහි සඳහන් සුදුසුකම් සියල්ල පරීක්ෂා කරනු ලබන අතර, අවශ්‍ය සුදුසුකම් නොමැති බව හෙළිවුවහොත් තනතුර සඳහා වන හිමිකම අවලංගු කරනු ලැබේ. ලිඛිත විභාගය පැවැත්වීම, ලැබෙන අයදුම්පත්‍ර සංඛ්‍යාව අනුව තීරණය කරනු ලැබේ.

6.2 ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පවතින පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.

6.3 සෑම අයදුම්කරුවෙකුම අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර තනතුරට අදාළ සියළුම සුදුසුකම් සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර ඉල්ලා ඇති සුදුසුකම් වලට අදාළ පරීක්ෂණවල ප්‍රතිඵල ද නිලවශයෙන් නිකුත් වී තිබිය යුතුය. ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටින අය අයදුම් කිරීම වරදක් සේ සලකනු ලබන අතර, සුදුසුකම් නොමැතිව එවනු ලබන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**07. ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් ඃ-**

අයදුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අයදුම්කරුවෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඕනෑම අවස්ථාවකදී ඔහු/ඇය පළාත් රාජ්‍ය සේවයෙන් පහ කිරීමට පිළිවන. ඉහත 6.3 පිළිබඳ අයදුම්කරුවන්ගේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

**08. විභාග ගාස්තු ඃ-**

විභාග ගාස්තුව රු. 300/- කි. මෙම මුදල අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට හෝ ඊදිනට පෙර ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, නැගෙනහිර පළාත නමට නැගෙනහිර පළාතේ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවිය හැකිය. ඒ සඳහා නිකුත් කරන රිසිට්පත අයදුම්පතේ අදාළ කොටුවේ

නොගැලවෙන සේ ඇලවිය යුතුය.(රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගැනීම සුදුසුය.) කුමන හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, ගාස්තුව වෙනත් විභාගයකටද මාරු කිරීමටද ඉඩ දෙනු නොලැබේ. **එසේම මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ.**

**09.** **අයදුම්කිරීමේ ක්‍රමය ඃ-**

9.1 මෙම දැන්වීමෙහි අවසානයේ යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4(සෙ.මී.21x29) ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම **පමණක්** ප්‍රයෝජනයට ගනිමින් **අංක 1.0 සිට 5.2 දක්වා පළමු පිටුවටද, අංක 6.0 සිට 12.0 දක්වා දෙවන පිටුවටද** ඇතුළත් වන සේ අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතුය.

9.2 **නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නිවැරදිව සම්පූර්ණ කර නොමැති, ආදර්ශ අයදුම්පත්‍රයේ ඇති විභාග සංකේත අංකය නොමැති, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති, නිවැරදිව සම්පූර්ණ කර නොමැති හා සහතිකවල පිටපත් අමුණා නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.** නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන අලාභය අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු සැලකිලිමත් විය යුතුය. එසේ නොවුවහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

9.3 මෙම දැන්වීමෙහි සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත ඉහත සඳහන් කර ඇති විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

9.4 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"EX/Rec/17/10"** යන්න සඳහන් කළ යුතුය.

9.5 අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන දිවුරුම් කොමසාරිස්වරයෙකු, තම කොට්ඨාශයේ ග්‍රාම නිලධාරීවරයා, සාමදාන විනිශ්චයකාරවරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු රු. 2,92,080 ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික එකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරණ නිලධාරියකු, බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තනතුරක් දරණ අයෙකු හෝ ලවා සහතික කරවා ගත යුතුය. රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් අයදුම්කරන්නේ නම්, අයදුම්පත්‍රයේ ඇති අයදුම්කරුගේ අත්සන දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු/දෙපාර්තමේන්තු ප්‍රධානියා ඉදිරියේ අත්සන් කොට, එම අත්සන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු/දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර, දෙපාර්තමේන්තු ප්‍රධානියා සහතික කර එවිය යුතුය.

9.6 සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය **2017.07.25** වැනි දින හෝ එදිනට පෙර පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. තැපෑලේදී අස්ථානගතවන අයදුම්පත්‍ර පිළිබඳ කිසිදු වගකීමක් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් භාරගනු නොලැබේ. **(ඉල්ලුම්පත්‍ර ලේකම්වරයාගේ පෞද්ගලික නමට එවීමෙන් වැළකිය යුතුය.)**

**ලේකම්,**
**පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,**
**නැගෙනහිර පළාත,**
**අංකඃ 198, ඇතුල් වරාය පාර,**
**ත්‍රිකුණාමලය.**

**10.** අයදුම්කරුවන්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

**i.** ජාතික හැඳුනුම්පත. **ii.** වලංගු විදේශ ගමන් බලපත්‍රය. **iii.** වලංගු රියදුරු බලපත්‍රය.

**11.** විභාගය පැවැත්වීම සඳහා යෝජිත ප්‍රධාන නගර හා එහි අංකයන් පහත සඳහන් වේ.

| නගරය | නගර අංකය | නගරය | නගර අංකය |
|---|---|---|---|
| ත්‍රිකුණාමලය | 01 | අම්පාර | 03 |
| මඩකලපුව | 02 | කල්මුණේ | 04 |

**සැ.යු. යම් නගරයකට ඉල්ලුම් කළ අයදුම්කරුවන් ගණන ප්‍රමාණවත් නොවේ නම් අයදුම්පතෙහි සඳහන් නගරයට යාබද නගරයක් වෙත යොමු කරනු ලැබේ.**

**12. විභාග පරිපාටිය ඃ-**

**12.1** ලිඛිත විභාගය ඃ-

විභාගය, ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ. මෙම විභාගය සිංහල, දෙමළ මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඉල්ලුම්කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| ප්‍රශ්ණ පත්‍රය | ලකුණු | කාලය |
|---|---|---|
| (i) අභියෝග්‍යතාව | 100 යි | පැය 1 යි |
| (ii) සාමාන්‍ය දැනීම | 100 යි | පැය 1 විනාඩි 30 යි |

(i) **අභියෝග්‍යතාව ඃ**

මෙම ප්‍රශ්න පත්‍රය මගින් අපේක්ෂකයන්ගේ තර්කානුකූල චින්තනය, විශ්ලේෂණ හැකියාව, තීරණ ගැනීමේ හැකියාව සහ ගණිතමය හැකියාව ආදිය පරීක්ෂා කරනු ලැබේ.

(ii) **සාමාන්‍ය දැනීම ඃ**

මෙම ප්‍රශ්න පත්‍රය මගින් අපේක්ෂකයන්ගේ ආර්ථික සංවර්ධනය, දේශපාලන, අධ්‍යාපන, සංස්කෘතික, සමාජීය, විද්‍යාත්මක සහ ක්‍රීඩා ක්ෂේත්‍රයන්හි දේශීය හා අන්තර්ජාතික වශයෙන් කාලීනව වැදගත් වන්නා වූ කරුණු පිළිබඳ දැනුම මැන බැලෙන ප්‍රශ්න වලින් සමන්විත වේ.

**12.2 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය ඃ-**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී පහත සඳහන් ක්ෂේත්‍රයන් සඳහා ලකුණු ලබාදෙනු ලැබේ.

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂයන් | උපරිම ලකුණු |
|---|---|
| ළමයින් රැකබලා ගැනීම සම්බන්ධයෙන් දැනුම | 30 |
| අයදුම්කරුගේ වගකීම පිළිබඳ අවබෝධය | 30 |
| පළපුරුද්ද | 15 |
| වෘත්තීය සුදුසුකම් | 15 |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 10 |
| **එකතුව** | 100 |

**සටහන ඃ-** බඳවා ගැනීමේ විභාගයේදී විභාගය සමත් ලෙස සැලකීම සඳහා සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම ලකුණු 40 කට වඩා ලබාගත යුතුය. එසේ වුවත් හුදෙක් එකී ලකුණු 40 ක් වන සමත්වීමේ ලකුණු සීමාව නිසාම පවත්නා පුරප්පාඩු ප්‍රමාණය පිරවීමට නොහැකි වන විටෙක නැගෙනහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ හා නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ එකඟතාවය සහිතව එම ලකුණු ප්‍රමාණය කිසියම් ප්‍රමාණයකින් පහළට ගෙන ඒමට නැගෙනහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමාට බලය ඇත.

මෙම දැන්වීමෙහි සඳහන් විධිවිධානවල කිසියම් සංශෝධනයක් අවශ්‍ය වුවහොත් ඒ සම්බන්ධයෙන් නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ගන්නා තීරණය අවසාන තීරණය වේ. එමෙන්ම මෙම විභාගය යම් විශේෂ හේතුවක් මත නොපැවැත්වීමේ අවශ්‍යතාවයක් පැන නැගුනහොත් ඒ පිළිබඳව ද රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වේ. එසේම මෙම තනතුරෙහි පවතින පුරප්පාඩු සංඛ්‍යාව සම්පූර්ණයෙන් පිරවීම, කොටසක් පිරවීම හෝ නොපිරවීම සම්බන්ධයෙන් අවසාන තීරණය ගැනීමේ බලය නැගෙනහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ/නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් මත පත්කිරීම් බලධාරියා සතු වේ.

එච්.ඊ.එම්.ඩබ්.ජී. දිසානායක,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
නැගෙනහිර පළාත.

**EX/Rec/17/10**

ආදර්ශ අයදුම්පත්‍රය

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.)

**නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයට අයත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ නිවාස මාතා, III ශ්‍රේණිය තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2017**

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
සිංහල - S      දෙමළ - T
*(අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න.)*

විභාගයට ඉදිරිපත් වන නගරයේ අංකය
*(11 වැනි ඡේදයේ සඳහන් නගර අංකය ලියන්න.)*

ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : ...........................................

**1.0** 1.1 මුලකුරු සමඟ නම : Rev/Mr/Mrs/Miss ...........................................
*(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් අගට යෙදෙන නම මුලින් ලියා මුලකුරු පසුව ලියන්න - :(උදා : PERERA, A.B.C.)*

1.2 මුලකුරු වලින් හැඳින්වෙන නම් : ...........................................
*(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)* ...........................................

1.3 සම්පූර්ණ නම : ...........................................
*(සිංහලෙන්/දෙමළෙන්)* ...........................................

1.4 ස්ත්‍රී/පුරුෂ භාවය      ස්ත්‍රී - F      පුරුෂ - M
*(අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න)*

1.5 දුරකතන අංකය : ...........................................

**2.0** 2.1 ස්ථිර ලිපිනය : ...........................................
*(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)* ...........................................

2.2 ස්ථිර ලිපිනය : ...........................................
*(සිංහලෙන්/දෙමළෙන්)* ...........................................

2.3 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය : ...........................................
*(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)* ...........................................

**3.0** 3.1 ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් නම්, ජාතික හැඳුනුම්පත් අංකය

3.2 උපන් දිනය : වර්ෂය      මාසය      දිනය

3.3 **2017.07.25** දිනට වයස : වර්ෂ      මාස      දින

**4.0** ජනවර්ගය : සිංහල      ශ්‍රී ලාංකික දෙමළ      මුස්ලිම්      වෙනත්
*(අදාළ කොටුව තුළ ✓ ලකුණ යොදන්න)*

**5.0** අධ්‍යාපන සුදුසුකම් :

**5.1** අ.පො.ස. (සා/පෙළ) විභාගය පිළිබඳ විස්තර

(i) විභාගයේ වර්ෂය : ...........................................
(ii) විභාග අංකය : ...........................................
(iii) ප්‍රතිඵල

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

**5.2** අ.පො.ස. (උ/පෙළ) විභාගය පිළිබඳ විස්තර

(i) විභාගයේ වර්ෂය : ...........................................
(ii) විභාග අංකය : ...........................................
(iii) ප්‍රතිඵල

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| 1. | | 3. | |
| 2. | | 4. | |

**6.0** පළපුරුද්ද : ……………….……………………………………..…………………….............................

……………..………………………………..…………………………………………...................................................

**7.0** ඔබ ශ්‍රී ලංකාවේ උසාවියකින් කවර හෝ අපරාධ වරදකට වරදකරු කරනු ලැබ තිබේද? එසේ නම් විස්තර සඳහන් කරන්න. : ……………………..…………………………………..………………………………..……………..

**8.0** රාජ්‍ය/නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයෙකු නම් ඃ-

8.1 දෙපාර්තමේන්තුව/කාර්යාලය : ...............................................................................

8.2 වර්තමාන තනතුර : ...............................................................................

8.3 මුල්පත්වීම් දිනය : ...............................................................................

8.4 වර්තමාන තනතුරෙහි ස්ථිර කළ දිනය : ...............................................................................

**9.0** විභාග ගාස්තු ගෙවූ (පැහැදිලි විස්තර සහිත) ලදුපත අදාළ කොටුව තුළ නොගැලවෙන සේ ඇලවිය යුතුය.

| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න. |
|---|

**10.0 අයදුම්කරුගේ සහතිකය**

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද මෙහි සියළුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

(ඇ) තවද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

(ඈ) මෙහි සඳහන් කිසිඳු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය : ……………………..…… ..…………………………………..……

අයදුම්කරුගේ අත්සන

**11.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම** *(මෙම දැන්වීමෙහි 9.5 අනුව)*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ……………………………………………………….මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ……………..………… දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවද, එම ලදුපත අලවා ඇති බවද සහතික කරමි.

………………………………..

අත්සන සහතික කරන්නාගේ අත්සන

දිනය : ...................................................

සහතික කරන්නාගේ නම : ...................................................

තනතුර : ...................................................

ලිපිනය : ...................................................

*(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)*

**12.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය** *(රජයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා පමණි)*

මෙම දෙපාර්තමේන්තුවේ ස්ථිර නිලධාරියකු වශයෙන් සේවය කරන ---------------------------------------- මයා/මිය/මෙනවිය ගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම තනතුරට තෝරා ගතහොත් ඔහු/ඇය දැනට සිටින සේවයෙන් නිදහස් කල හැකි බවත් ඔහු/ඇය විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත් මෙයින් සහතික කරමි.

...........................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

දිනය : ...................................................

නම : ...................................................

තනතුර : ...................................................

ලිපිනය : ...................................................

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.